"බුද්ධි කලම්බනයක නවමු මග"

# ශ්‍රී ලංකා පරිපාලන සේවා

## විවෘත/ සීමිත තරග විභාගය

## SLAS (OPEN/ LIMITED)

10

### සුවිශේෂී සම්මන්ත්‍රණ මාලාව

2017 අප්‍රේල් 22 සෙනසුරාදා

බොරැල්ල YMBA හිදී

2017 අප්‍රේල් 23 ඉරිදා - බොරැල්ල කේරි විද්‍යාලය හිදී

පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා


| අන්තර්ගතය | පිටු |
|---|---|
| ★ සාමාන්‍ය බුද්ධිය<br>SLAS / 2017/IQ/14 | 01 - 06 |
| ★ සාමාන්‍ය බුද්ධිය - අමතර නිබන්ධනය<br>SLAS / 2017/IQ/EX/09 | 07 |
| ★ සාමාන්‍ය දැනීම - අමතර නිබන්ධනය<br>SLAS / 2017/GK/EX/09 | 08 - 09 |
| ★ රචනය හා සාරාංශය<br>SLAS / 2017/ES/03 | 10 - 17 |
| ★ සාරාංශය<br>SLAS / 2017/ES/04 | 18 |


දෛනික සම්පත් දායකත්වය

ප්‍රධාන ආරාධිත දේශිකා :

## අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය

ඇතුළු

## ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක්

වැඩි විස්තර 0777 356968, 0716 364525

Facebook - Exams.govnew

''බුද්ධි කලම්බනයක නවමු මග''

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## සාමාන්‍ය බුද්ධිය

- පහත සඳහන් රූප සටහනෙහි ජනගහනයෙන් කොටස් හතරක් නියෝජනය වෙයි. කුඩාම ත්‍රිකෝණය ගුරුවරු නියෝජනය කරයි. ලොකුම ත්‍රිකෝණය දේශපාලනඥයන් නියෝජනය කරයි. වෘත්තය උපාධිධාරීන් සඳහා වන අතර, චතුරස්‍රය (Rectangle) පාර්ලිමේන්තු සාමාජිකයන් නියෝජනය කරයි. මෙම රූප සටහනේ විවිධ ස්ථාන විවිධ අක්ෂරවලින් නියෝජනය කරයි. ඉහත තොරතුරු පදනම් කරගෙන එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සොයන්න.




01. පහත සඳහන් දේශපාලනඥයන් අතුරින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන්නේ කවරහු ද?

a. C,L,G,H b. D,L c. A,C d. A,D,C,L

02. පහත සඳහන් අයගෙන් දේශපාලනඥයන් නොවන උපාධිධාරීන් හෝ ගුරුවරුන් කවරහු ද?

a. L,H b. E,F c. C,G d. C,D

03. පහත සඳහන් උපාධිධාරීන් අතුරින් දේශපාලනඥයන් මෙන් ම ගුරුවරුන් ද වන්නේ කවරහු ද?

a. L,C b. L,H c. C,H d. D,L

04. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරින් උපාධිධාරියකු මෙන්ම ගුරුවරයකු ද වන්නේ කවරහු ද?

a. H b. G c. L d. C

05. පහත දැක්වෙන දේශපාලනඥයන් අතර ගුරුවරයකු හෝ උපාධිධාරියකු නොවන්නේ කවරහු ද?

a. B,G b. L,H c. C,D d. A,B




- **මෙහි දැක්වෙන වෘත්ත තුන මගින් ගුරුවරුන්, ඉංජිනේරුවන්, උපාධිධාරීන් නියෝජනය කෙරේ. එම වෘත්ත එකිනෙක හරහා ගොස් ඇත. එම වෘත්ත ඇතුළත එක් එක් කොටස ABCDEFG ලෙස නම් කර ඇත. මෙම රූප සටහන අධ්‍යයනය කර පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.**

06. සමහර ඉංජිනේරුවන් ගුරුවරුන් ය.
a. D b. E c. G d. F

07. සමහර ගුරුවරුන් උපාධිධාරීන් ය.
a. B b. A c. D d. E

08. සමහර ඉංජිනේරුවන් උපාධිධාරීන් ය.
a. F b. G c. D d. A

09. සමහර උපාධිධාරීන් ඉංජිනේරුවන් හෝ ගුරුවරුන් ය.
a. F b. A c. E d. G

10. සමහර ගුරුවරුන් ඉංජිනේරුවන් හෝ උපාධිධාරීන් හෝ නොවේ.
a. G b. F c. B d. C

- **පහත දැක්වෙන විස්තර කියවා පිළිතුරු සපයන්න.**

i. P,Q,R,S, සහ U යනු සංගමයක සාමාජිකාවන් ය. මේ හැමට වෙන වෙන රැකියා තිබුණි. නීතිඥයකු ඉංජිනේරුවරයකු, ගෘහ නිර්මාණ ශිල්පියකු, වෛද්‍යවරයකු, ගුරුවරයකු සහ ගෘහණියක ලෙස ය.
ii. මෙම කණ්ඩායමේ කාන්තාවන් දෙදෙනකු විය.
iii. R යනු T සමඟ විවාහ වී සිටින ගෘහණියයි.
iv. වෛද්‍යවරයා, ගුරුවරියක වන P සමඟ විවාහ වී සිටියි.
v. Q යනු නීතීඥවරයෙකි. U තවම අවිවාහක ය.

11. P හා Q අතර ඇති සබඳකම කුමක් ද?
a. සහෝදරයා b. බෑනා c. පියා d. දත්ත ප්‍රමාණවත් නැත.
e. මෙයින් එක් අයෙකු හෝ නො වේ.

12. මෙම කණ්ඩායමේ වෛද්‍යවරයා කවරෙක් ද?
a. S b. U c. T d. දත්ත ප්‍රමාණවත් නැත.
e. මෙයින් එක් අයෙකු හෝ නො වේ.

13. පහත දැක්වෙන අය ගෙන් විවාහක යුවල කවරෙක් ද ?
a. QT b. PT c. PC d. QR d. කිසිවෙකු නොවේ.

14. දී ඇති කණ්ඩායම් වලින් සැමියන් නියෝජනය කරන කණ්ඩායම කුමක් ද?
a. TR b. PS c. TU d. QT d. එකක් වත් නො වේ.

15. T ගේ වෘත්තීය කුමක් ද?

a. ඉංජිනේරුවරයා　　b. ගෘහ නිර්මාණ ශිල්පියා

c. ඉංජිනේරුවරයා හෝ ගෘහ නිර්මාණ ශිල්පියා　　d. මෙයින් කිසිවකු නොවේ.

16. **පහත සඳහන් පළමු වචනයේ පළමුවෙනි අකුර ද, දෙවන වචනයේ දෙවෙනි අකුර ද, තෙවන වචනයේ තුන්වන අකුර ද, අවසාන වචනයේ අවසාන අකුරද වන පරිදි තෝරාගත් අකුරුවලින් සෑදෙන ග්‍රන්ථයේ කතුවරයාගේ නම ඉදිරියේ ඇති හිස්තැනෙහි ලියන්න.**

උදාහරණ : සිළුමිණ, ජලචර පක්ෂියෙකි, සිංහල, පැරණි ගම්පාලන ක්‍රමය, පරාක්‍රමබාහු

සි හ ං සයා හ ගම්ස බා හු = සිංහබාහු = එදිරිවීර සරත්චන්ද්‍ර

i හඳහාමි, යම් කෙනෙකුගේ ඉපදීම, කිහිපය, තෘණ පවුලේ විශාලම ශාකය = ........................................

ii. විවිධ, රාගයෙන් යුත්, ව්‍යග්‍ර, යාපා පටුනට නූතන ව්‍යවහාරය = ........................................

iii. පූජිත, බිම්බිසාර රජුගේ පුතා, කහවනු, සළු වියන්නී, ජපානය = ........................................

iv. පිස්සා, පියාට මගේ නෑකම, හක්මන, ප්‍රසිද්ධ ජපන් යතුරු පැදි වර්ගයකි. = ........................................

v. මනමේ, යම් අයකුගේ පරම්පරාව, ජනතාව, පෙරට තබන පය, තායිවානය = ........................................

## II කොටස

17. **පළමු වචන යුගලයෙහි අක්ෂර සම්බන්ධතාව සලකා දෙවන වචනයට සමාන වන රහස් වචනය තිත් ඉර මත ලියන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| vi. | TEACHER | = | SDZBGDO | : | STUDENT | = | ............................. |
| vii. | MAN | = | OCP | : | WOMAN | = | ............................. |
| viii. | FATHER | = | UZGSVI | : | MOTHER | = | ............................. |
| ix | ARMY | = | BSNZ | : | TERRORISTS | = | ............................. |
| x | SUNIL | = | RTTVMOHJM | : | ........................ | = | JLTVLNZBQSHJ |

## III කොටස

18. පළල මෙන් දෙගුණයක් දිග ඇති සෘජු කෝණාශ්‍රාකාර කාමරයක එක් එක් පැත්ත බැගින් දික්කල විට ලැබෙන ක්ෂේත්‍රඵලය, කාමරයේ පළමු ක්ෂේත්‍රඵලයට වඩා වර්ග මීටර් 145 කින් වැඩිවේ. කාමරයේ දිග මීටර් කීයද ?

19. තම පුතාගේ දැන් වයස මෙන් තුන් ගුණයක් වයස ඇති මවක්, මෙයට අවුරුදු 8 කට පෙර පුතාගේ වයස මෙන් හතර ගුණයට අවුරුදු 4 ක් එකතු විය යුතු වයසින් සිටියා ය. දැන් මවගේ වයස කීයද ?

20. පෙරේදා මගේ උපන් දිනයයි. දින 12 කට පෙර නිහාල් කී ය. නිහාල්ගේ උපන් දිනය මේ වසරේ අඟහරුවාදා දිනකට යෙදී තිබුණි. අනිද්දා සතියේ කවදාද ?

21. දිග පළල 5", 4", 4" වන පෙට්ටියක ඇතුළත කඩදාසි ඇලවීමට රු. 60/- වැය විය. එමෙන් තුන් ගුණයක් විශාල පෙට්ටියක කඩදාසි ඇලවීමට කොපමණ මුදලක් වැය වේද ?

22. බෝල්පොයින්ට් පෑන් 3ක් සහ කොපි පොත් 4 ක් මිලට ගත් නිහාල් වෙළෙන්දාට රුපියල් 20/- ගෙවූ අතර, කොපි පොත් 2 සහ බොල්පොයින්ට් පෑන් 5 ක් මිලට ගත් රමනී රු. 24/- ක් ගෙවීය. පෑන් 2 ක් සහ කොපිපොත් 2 ක් මිලදී ගැනීමට මා විසින් කොපමණ මුදලක් වැය කළ යුතුද ?

- **උදාහරණය තේරුම් ගෙන පහත සඳහන් ගැටලුවල හිස්තැන් පුරවන්න.**

උදා - (4, 5) 18 (10, 2) 21 (9,4) උත්තරය 26
ක්‍රමය - (4 5) x 2 = 18 : (10 2 ) x 2 = 24 එබැවින් (9 4 ) x 2 = 36

23. (15 17) 16 (20 28) 24 (5 3) .............................
24. (8 3 ) 15 (9 2 ) 14 (12 8 ) .............................
25. (17 10) 35 (18 7) 55 (.... 3) .............................
26. (5 3) 64 (2 7) 81 (6 3) .............................
27. (56 14) 8 (72 9) 16 (75 ....) .............................

- **පහත දී ඇති අනුරූපිකයට ගැලපෙන වචන ජෝඩුව වරහන් තුළ ඇති පහෙන් තෝරා යුගලයට අයත් අකුර වටා කවයක් අඳින්න.**

28. ස්ථාවර : පෙරලීම .................................... 1. උදාසීන : කම්මැලි 2. දෘඪ : නැමීම 3. කැඩෙන : බිඳීම 4. නුවණැති : පණ්ඩිත 5. මානව : සත්ත්ව

29. බන්ධනාගාරය : අපරාධය .................................... 1. විනිශ්චයකරු : අපරාධකරු 2. නිදහස : කුරුල්ලා 3. සිරගෙය : හොරා 4. කැරකෝප්පුව : මරණය 5. විඳීම : පීඩනය

30. බහු : බොහෝ .................................... 1. ගොවි : කෘෂි 2. ක : අකුර 3. කු : නරක 4. උපත : මනුෂ්‍යයා 5. පොත : පොත් ගුල

31. ගොතය : කථාව .................................... 1. උගුල : වැටෙනවා 2. පැටලීම : ඇවිදීම 3. ඇවිදීම : ගමන 4. සැර කිරීම : සාපය 5. ඇල්ල : ගඟ

32. කොස් : මඤ්ඤොක්කා .................................... 1. දොඩම් : අඹ 2. බතල : ගෝවා 3. කෙසෙල් කැන් : බතල 4. උක් : සීනි 5. කරවිල : වැල

33. වැරදීම : විඳීම .................................... 1. කැපීම : කැපුම 2. දිව්රීම : දැරීම 3. ඉදිමීම : තුවාලය 4. දිවීම : පැනීම 5. මාරුවීම : මැරීම

34. වතු : පිටි .................................... 1. කල : බල 2. තල : පෙළ 3. එහි : මෙහි 4. ඉඩ : කඩ 5. දැඩි : මොට

35. වෙළඳාම : ආර්ථිකය .................................... 1. ශ්‍රමය : විභාගය 2. භූගෝල විද්‍යාව : ඉතිහාසය 3. පෙනුම : යහගුණ 4. ජීව : විද්‍යාව 5. ක්‍රියා : චරිතය

36. ගිණි : ගින්දර .................................... 1. හරකා : හරක් 2. මිනිසා : මිනිස් 3. ජලය : ජලාශය 4. කල : කලස් 5. මුහුද : මාළු

37. විස්තරය : චිත්‍රය .................................... 1. චරිතය : ගුණා ගුණ 2. වචන : රූප 3. පාඨය : වචන 4. පාට : වර්ණ 5. ඇඳීම : මැකීම

- **පහත පෙනෙන එක් එක් කියමන හෝ ප්‍රස්ථා පිරුළ හෝ දෙන අර්ථයට, අදහසට විරුද්ධ අර්ථයක් අදහසක් දෙන වචන තෝරා එයට යටින් ඉරක් අඳින්න.**

38. කළ දුටු කල වළ ඉහගත් (විචක්ෂණ, මසුරු, අදූරදර්ශී, ප්‍රඥා සම්පන්න, අවංක)
39. ගොනා පිට හකුරු පටවන්නා වගෙයි. (අර්ථ සාධක, ව්‍යර්ථ, ශූන්‍ය, අනර්ථ, බාධක)
40. තම හිසට තම අතමය සෙවනැල්ල (ස්වයංපෝෂිත, පරාධීන , ප්‍රෞඪ, නිහතමානි, කෲර)
41. දේසේ හැටියට බාසේ (දිගින් දිගටම, අනුකූල, ව්‍යාජ, දරදඬු, නො ගැලපෙන)
42. රජ ගෙදර පරවියා වගෙයි. (නිදහස, සංස්කරණය, සංයෝජනය, වශීකරණය, නිරාකරණය)

- **අංක 43 සිට 47 දක්වා ප්‍රශ්න පහත දැක්වෙන වගුව මත පදනම් වෙයි.**

| | | තීර | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **I** | **II** | **III** | **IV** | **V** | **VI** |
| පේළි | අ | මෙහෙකරුවා | පරන්තන් | නිදන | පුරවනුව | පරන්තප | ගල්ගමුව |
| | ඇ | නිකිණි | වක්කඩ | නිරතුරු | දූරිවිය | නිබඳ | මන්මදයා |
| | ඉ | සදිසි | ගල්මඩම | රත්නපුර | සිපිරි | ගොවියා | අගස්ති |
| | අ | කටුස්සා | කිරිඳි | මිත්තනිය | සතර | කිකිළි | සමය |
| | එ | පිවිසි | මන්දාරම | සතත | කන්කළුව | නිතිනි | නිකිණි |
| | ඔ | සන්නයන | අවරගිර | ළිහිණි | ගිගිරි | විසිරි | ඇතින්න |

ඉහත වගුවේ ඇතුළත් කොට ඇති පද 36 පහත දැක්වෙන වර්ගවලට වෙන් කළ හැකි ය.

A - එකම අර්ථය ඇති පද
B - මුලත් අගත් එකම අක්ෂරය ඇති පද
C - සියලු ම අක්ෂරවල ඉස්පිලි ඇති පද
D - මුල් අක්ෂරය මැදට ද යෙදෙන පද
E - පක්ෂීන් හැඳින්වෙන පද
F - අග අක්ෂරය මැදට ද යෙදෙන පද
G - එක පදයක මුල් අක්ෂරය තවත් පදයක දෙවන අක්ෂරය ලෙස යෙදෙන පද
H - ස්ත්‍රී ලිංග පද
I - පුරුෂ ලිංග පද
J - අර්ථ කීපයක් ඇති පද
K - ඉස්පිලි ඉවත් කළ විට අර්ථවත් තවත් පදයක් ලැබෙන පද

- **මේ පද වර්ග හඳුනාගෙන මතු දැක්වෙන ගැටලුවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

43. C, D, G , H සහ J වර්ගවලට අයත් පද ඇතුළත් තීරය කුමක් ද? (.................................)
44. C, D, F, H සහ J වර්ගවලට අයත් පද ඇතුළත් තීරය කුමක් ද? (.................................)
45. A, B, C, H සහ J වර්ගවලට අයත් පද ඇතුළත් තීරය කුමක් ද? (.................................)
46. A, B, E, I සහ K වර්ගවලට අයත් පද ඇතුළත් තීරය කුමක් ද? (.................................)
47. C, F, I, J සහ K වර්ගවලට අයත් පද ඇතුළත් තීරය කුමක් ද? (.................................)

- **එක් එක් පේළියෙහි දකුණු පස ඇති අක්ෂර හෝ සංඛ්‍යා මාලාව වම් පස තීරයෙහි ඇති අක්ෂර හෝ සංඛ්‍යා මාලාවට හැම අතින්ම සමාන නම්, තිත් ඉර මත ✓ ලකුණ ද, අසමාන නම් ✗ ලකුණ ද යොදන්න.**

48. ඪඪවවමමමමමවවඪඪමමව ....................................... ඪඪමවමමමමමවවඪඪමමව
49. ccccceeeeecccecc ....................................... ccccceeeeeceeecc
50. ටවවටටටවවටටටමටටමටව ....................................... ටවවටටටවවටටටමටමටව
51. සසපපයයපපසසසසයසයය ....................................... සසපපයයපපසසසයසසයය
52. vvvwwwvwwvvvwwv ....................................... vvvwwwvwwvvvwwwv

- පහත එක් එක් ගැටළුවේ සංඛ්‍යා ප්‍රමාණ දෙකක් දී ඇත. මේ සංඛ්‍යා දෙක සසඳා **A** ප්‍රමාණය වඩා විශාල නම් **A** ද, ඊ ප්‍රමාණය වඩා විශාල නම් **B** ද, ප්‍රමාණ දෙක සමාන නම් E ද තිත් ඉර මත ලියන්න.

| | **A** | **B** | |
|---|---|---|---|
| 53. | $2+3-(-1)-6$ | $6+5-11$ | ............................................ |
| 54. | $\frac{1}{2} + \frac{2}{3}$ | $\frac{1}{2}+\frac{1}{3}+\frac{1}{3}$ | ............................................ |
| 55. | $\frac{0.0001 \times 0.001}{0.01 \times 0.00001}$ | $\frac{0.0002 \times 0.002}{0.02 \times 0.00002}$ | ............................................ |
| 56. | $\sqrt{25} + \sqrt{16}$ | $\sqrt{25+16}$ | ............................................ |
| 57. | 1 ක් රු. 5.00 බැගින් අඹගෙඩි 25 ක මිල | 3 ක් රු. 18 බැගින් අඹගෙඩි 21 ක මිල | ............................................ |

දකුණු පස ඇති ආකාරානුබද්ධ සංකේත මාලාව අනුව, $\underline{(36+25+16)}$ යනු විජිත නම්, පහත පද සොයන්න.

58. $9 + 12 + 8 + 6$

59. $10 + 20 + 12 + 2 + 6$

60. $36 + 12 + 2 + 6$

| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| 1 | න | ග | ක | ර | ස | ප |
| 2 | ග | ර | ය | න | අ | රා |
| 3 | ම | ය | ප්‍ර | රා | යා | ව |
| 4 | ර | න | රා | ත | නු | තු |
| 5 | ස | අ | යා | නු | ජි | දු |
| 6 | ය | රා | ව | කු | දු | වී |

‘‘බුද්ධි කලම්බනයක නවමු මග’’

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරඟ විභාගය

## සාමාන්‍ය බුද්ධිය - අමතර නිබන්ධනය

01. 3 , 5 , 8 , 7, 13 , 9 , 18 , 11 , 23

02. 0 , 3 , 8 , 15 , 24 , 35 , 48
0 + ③, 3 + ⑤, 8 + ⑦, 15 + ⑨ , 24 + ⑪, 35 + ⑬

03. 5 , 6 , 11 , 7, 8 , 15 , 9 , 10 , 19 , 11
5 + 6 = 11, 7 + 8 = 15, 9 + 10 = 19

04. 2 , 3 , 5 , 4 , 6 , 7 , 9 , 8 , 10 , 11 , 13
2,3 6,7 10,11
5,4 9,8 13,12

05. 2 , 8 , 3 , 3 , 12 , 7 , 4 , 16 , 11 , 5 , 20 , 15
+4

06. (80 : 5) 17 ; (30 , 3) 11 ; (56, 7) 9
$\frac{80 + 5}{5} = 17$ $\frac{30 + 3}{3} = 11$ $\frac{56 + 7}{7}$

07. (8, 12) 12 ; (9,4) 15 ; (12, 20) 24
4 x 3 5 x 3 8 x 3

08. (2, 16) 64 , (5, 20) 16 , (6, 54) 81
$(16 / 2)^2$ $(20 / 5)^2$ $(54 / 6)^2$

09. (5 , 3) 3 , (8 , 5) 3 , (14 , 3) 9
2 x 5 - 1/3 8 x 2 - 1/5 2 x 14 - 1/3

10. (2 , 8) 7 , (12 , 20) 35 , (6, 20) 20
$\frac{2 \times 5 + 4}{2}$ $\frac{12 \times 5 + 10}{2}$ $\frac{6 \times 5 + 10}{2}$

11. 1 , 3 , 5 , 6 , 9 , 12 , 13 , 17 , 21 , 22
+2 +2 +1 +3 +3 +1 +4 +4 +1

12. 1, 4, 9, 16, 25
$1^2 , 2^2 , 3^2 , 4^2 , 5^2$

13. 17 , 10 , 27 , 20 , 37 , 30 , 47
+ 10 + 10 (above)
+ 10 + 10 + 10 (below)

14. 37 , 35 , 32 , 28 , 23
-2 -3 -4 -5

15. x , z , b , d , f , h , i

| | | | | | |
|---|---|---|---|---|---|
| a | b | c | d | e | f (6) |
| g (7) | h | i | j | k | l (12) |
| m (13) | n | o | p | q | r (18) |
| s (19) | t | u | v | w | x (24) |
| y (25) | z | | | | |

16. 120 , 240 , 80 , 320 , 64 , 384
x 2 - 3 x 4 + 5 x 6

17. $\frac{a}{z}$ $\frac{x}{c}$ $\frac{e}{v}$ $\frac{t}{g}$ $\frac{l}{r}$ $\frac{p}{k}$
$\frac{1}{26}$ $\frac{24}{3}$ $\frac{5}{22}$ $\frac{20}{7}$ $\frac{9}{18}$ $\frac{16}{11}$

18. a + 3c , c + 5e, e + 7g , g + 9i
1 + 33 3 + 55 5 + 77 7 + 99

19. 1920 , 192 , 24 , 4 , 1 , 1/2
+10 -8 -6 +4 +2

20. 75 , 69 , 62 , 56 , 49 , 43
-6 -7 -6 -7 -6

21. 1.5 , 2.25 , 3.5 , 3.75 , 5.5 , 5.25 , 7.5

22. 32465 , 53246 , 65324 , 46532 , 24653

23. 3 , 14 , 33 , 60 , 95 , 138
11 19 27 35 43
8 8 8 8

24. 1 , 9 , 24 , 46 , 75 , 111
8 15 22 29 36
+7 +7 +7 +7

25. 4 , 10 , 28 , 82 , 244
6 18 54 162
x3 x3 x3

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## සාමාන්‍ය දැනීම - අමතර කියවීම

### පැරා ඔලිම්පික් ඉතිහාසය

ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව (International Paralympic Committee - IPC) විසින් සංවිධානය කරනු ලබන පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල ප්‍රධාන ජාත්‍යන්තර තරග ඉසව් රැසකින් සමන්විත අතර විවිධ කායික ආබාධිත තත්වයන්ගෙන් පෙළෙන ක්‍රීඩකයන් දිරිගැන්වීමේ අරමුණින් මෙය පවත්වනු ලබයි. ඔලිම්පික් ක්‍රීඩා උළෙලට සමගාමීව පවත්වනු ලබන මෙය 1988 දී දකුණු කොරියාවේ සියොල් නගරයේ ග්‍රීස්ම (Summer games) ඍතු උළෙල පවත්වනු ලැබීය. සෙසු සාමාන්‍ය ක්‍රීඩකයන් මෙන් තරග වැදීමට මෙම ආබාධිත තරඟකරුවෝ මහත් පරිශ්‍රමයක් දරති.

පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල ආරම්භ වීමට ප්‍රථම මෙම ආබාධිත සහිත ක්‍රීඩකයන් සෙසු සාමාන්‍ය ක්‍රීඩකයන් සේම ඔලිම්පික් ක්‍රිඩා තරග ඉසව් සඳහා සහභාගී කරගනු ලැබීය. පළමු ක්‍රීඩකයා ලෙස ජිම්නාස්ටික් ක්‍රීඩාවෙහි දක්ෂ ජර්මන් ජාතික George Eyser 1904 දී තරඟයට මුහුණ දෙනු ලැබීය. තම කෘතිම පාදයන් සමග ඔහු එම තරග ඉසව්ව සඳහා තරග කළේය.

හංගේරියානු ජාතික Kuroly Jakass ඉලක්කයට වෙඩි තබීමේ තරග ඉසව්ව සඳහා 1948 දී හා 1952 ග්‍රීස්ම ඍතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා තරග කරනු ලැබීය. දකුණු අත අහිමි ක්‍රීඩකයකු වූවත් තම වම් අත ආධාරයෙන් ඉලක්කයට වෙඩි තැබීමේ ඉසව්ව සඳහා සහභාගි විය. පෝලියෝ රෝගැති ඩෙන්මාක් ජාතික Lis Hartel පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙලට ප්‍රථම ඔලිම්පික් ක්‍රීඩා උළෙලට අශ්වාරෝහක ක්‍රීඩා තරග ඉසව්ව සඳහා සහභාගි වී 1943 දී රිදී පදක්කම දිනාගනු ලැබුවේය.

පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල තුළ සුවිශේෂී අවස්ථා රැසක් පැවතුණි. පළමු නිල පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල 1960 දී රෝමයෙහි පැවතුණ අතර ක්‍රීඩකයන් 400 ක් පමණ රටවල් 23 ක් නියෝජනය කරමින් සහභාගි විය. 1960 දී ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වන වසරේම පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වීමට කටයුතු කරන ලදී. ක්‍රීඩා තරග ඉසව් මුලින්ම විවෘත කරන ලද්දේ රෝදපුටු වල සිටින ආබාධිත ක්‍රීඩාකයන් සඳහා පමණයි.

නමුත් 1976 ග්‍රීස්ම ඍතුව සඳහා වූ ක්‍රීඩා උළෙලෙන් පසුව අනෙකුත් ආබාධිත තත්ත්වයන්ගෙන් පෙලුණු තරඟකරුවන් සඳහාද අවස්ථාව ලබාදෙන ලදි. එය ක්‍රිඩකයන් 1600 ක් හා රටවල් 40 ක් දක්වා පුළුල් කරනු ලැබීය. ශීත ඍතුව සඳහා වූ පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල1976 දී ස්වීඩනයේ දී පවත්වනු ලැබීය. විවිධ තරග අවස්ථාවන් යටතේ ආබාධිත ක්‍රීඩකයන් සඳහා තරග කිරීමට ලබාදුන් පළමු අවස්ථාව මෙය විය.

**පැරා ඔලිම්පික් ඉතිහාසය තුළ විශිෂ්ටයෝ**

පැරා ඔලිම්පික් ඉතිහාසය තුළ ඇමරිකා එක්සත් ජනපදය නියෝජනය කරමින් පිහිනුම් තරග ඉසව් සඳහා සහභාගී වූ Trischa Zorn තම දෑස් නොපෙනුණත් එම තරග ඉසව්වෙන් රන් පදක්කම් 41 ක් ඇතුළුව මුළු පදක්කම් 55 ක් දිනා ගනිමින් පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල විචිත්‍රවත් කළාය. 1980 සිට 2004 දක්වා ඇය තම දක්ෂතාවය මනාව පිළිඹිබු කළාය. ඇය 1980 දී ඇමරිකාවේ ඔලිම්පික් පිහිනුම් කණ්ඩායමට වෙන් වූ විකල්ප සාමාජිකාවක් ලෙස කටයුතු කළත් කිසිදා ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් නියෝජනය කළේ නැත.

නවසීලන්තය නියෝජනය කරමින් දුනු ක්‍රීඩා තරග ඉසව්ව සඳහා ප්‍රථම වරට සහභාගි වූ Nevoli Fairhall 1984 දී ලොස් ඇන්ජලීස්හි පැවැත්වූ ග්‍රීස්ම ඍතු ඔලිම්පික් උළෙල සඳහා තරග කරනු ලැබීය.

# ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව

(International Paralympic Committee)

ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අභිවෘද්ධිය උදෙසා ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානය නමින් (International Sports Organization for the disabled) ISOD, 1964 වසරේදී පළමු සංවිධානය ආරම්භ කරන ලදි. මෙම සංවිධානයේ ඇරඹුමට දායක වූවන් හට, ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය කිරීමට අවස්ථාව ලබාදිය යුතු බවට අදහසක් ඇතිවිය.

අවසානයේ මෙම සංවිධානය (International coordinating Committee of world sports Organization for the disabled (ICC) [ ආබාධිත තරඟකරුවන් වෙනුවෙන් ලොව ක්‍රීඩා ඉසව් සමබන්ධීකරණය කරනු ලබන ජාතයන්තර ආයතනය ] නමින් 1982 දී පිහිටුවනු ලැබීය. අන්තර්ජාතික ඔලිම්පික් කමිටුව ඉදිරියේ ආබාධිත ක්‍රිඩකයන්ට තරඟ වැදිමට එමගින් අවස්ථාව හිමිවිය.

මෙම සාමූහික උත්සාහයක සාර්ථකත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස 1988 වසරේදි ග්‍රීස්ම ඍතු පැරා ඔලිම්පික් සියොල්හි පැවැත්වීය. සියලුම රටවල් නියෝජනය කරමින් ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ඇති තරඟ ඉසව් හා වැඩසටහන් තවත් පුළුල් කළ යුතු බවට එහිදී අවශ්‍යතාවය ඇතිවිය. පැරා ඔලිම්පික් හසුරුවනු ලබන එම මණ්ඩලය '' ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව '' (International Paralympic Committee) නමින් 1989 සැප්තැම්බර් මස 22 පිහිටුවන ලදි.

" Spirt of Motion " යන ආදර්ශ පාඨයෙන් ඇරඹේ. ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව ලොව සමස්ත රටවල්හි ක්‍රිඩා තරඟ අවස්ථාවන් හසුරුවනු ලබන ආයතනයක් ලෙස පිළිගැනුණු අතර රටවල් 176 ක පැරා ඔලිම්පික් කමිටු නියෝජනය කරන ලදි. ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව (International Paralympic Committee) සභාපති ධූරය දරන ලද්දේ 'Sir Philip Craven' (සර් පිලිප් ක්‍රාවේන්) වන අතර ඔහු මහා බ්‍රිතාන්‍ය ජාතිකයෙකි. මෙම ආයතනයේ මුලසුන හෙබවූ ඔහු එම ආයතනයේ සාමාජිකයෙක් ද විය. ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුවේ මුලස්ථානය (Bonn Germany) ජර්මනියේ බෝන් හි පිහිටි අතර ග්‍රීස්ම හා ශීත ඍතු පැරා ඔලිම්පික් ක්‍රීඩා උළෙල සංවිධානය කරනු ලැබීම මෙහි මූලික වගකීම විය.

පැරා ඔලිම්පික් මලල ක්‍රීඩා, පිහිනුම්, ඉලක්කයට වෙඩි තැබීම, කඳු තරණය, අයිස් හොකී, රෝද පුටු වැනි තරඟ ඉසව් 9 කින් මෙය සමන්විතය. ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව ජාතික පැරා ඔලිම්පික් කමිටු (National Paralympic Committee) සහ ජාත්‍යන්තර ක්‍රිඩා එකමුතුවේ (International Sporting Federations) සහයෝගීතාවයෙන් සැදුනකි.

''බුද්ධි කලම්බනයක නවමු මග''

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## රචනය හා සාරාංශය

### ආදර්ශ රචනා 01

### මනා විධිමත් සැලසුමකින් තොර ජීවිතය අයාලේ යයි.

ගොඩනැගිලි, භාණ්ඩ, වාරිමාර්ග, මහාමාර්ග ආදී සියළු සාර්ථක නිර්මාණයන් සලකා බැලීමේදී ඒවායේ මූලාරම්භයේ පටන්ම මනා විධිමත් සැලැස්මක් තුළින් එම නිර්මාණ බිහි වූ බව දක්නට ලැබේ. කෙතරම් දක්ෂ ඉංජිනේරුවෙකු වුවද විධිමත් සැලැස්මකින් තොරව යම් දෙයක් නිර්මාණය කිරීමට යාම තුළ ඔහුගේ නිර්මාණය අසාර්ථක විය හැක. වර්ථමානයේ ලොව සියළු සාර්ථක ව්‍යාපාර සළකා බැලූ කල එම ව්‍යාපාරයන්හි සැලසුම්කරණයට දී ඇත්තේ මූලිකම ස්ථානය එම ව්‍යාපාරයන් තුල සැලසුම්කරණ දෙපාර්තමේන්තු පවා පවත්වා ගෙන යාම තුළින් ගම්‍ය වන කරුණක් නම් ඕනෑම දෙයක සාර්ථකත්වයට මනා විධිමත් සැලැස්මක් අත්‍යවශ්‍යවන බවයි.

එසේම පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට සහ පුද්ගලයා තම ජීවිතය සාර්ථකව පාලනය කර ගැනීමට නම් එම ජීවිතය තුළ මනා විධිමත් සැලැස්මක් තිබීම අත්‍යවශ්‍යය කරුණකි. පුද්ගලයෙකු රාත්‍රියට නිදා ගැනීමට යාම තුලින් අපේක්ෂා කරනුයේ එම දවස තුළ සිදු කළ කාර්‍යභාරයන් අවසානයේ ඔහුගේ ශරීරයට මෙන්ම මනසට ද විවේචකයක් ලබා දීමයි. එසේම උදා වන නව දිනයේ දෛනික වැඩ කටයුතු ප්‍රබෝදමත්ව ඇරඹීමට ද මෙම පෙර දින සුව නින්ද උපකාරී වේ. එම පුද්ගලයා රාත්‍රියට නින්දට යන්නේ පසු දින වැඩ කටයුතු පිළිබඳ සැලසුමකින් තොර වූ විට ඔහුට පසු දින අවධි වීමට තීරණය කළ වේලාවක් නොමැත. එවිට සැලසුමකින් තොරව ප්‍රමාද වී අවධි වන පුද්ගලයාට එදින වැඩ කටයුතු වශයෙන් නොයෙක් දෑ මතක් වන්නට පටන් ගනී. මෙලෙස මොහොතක් පාසා සැලසුමකින් තොරව ගත කිරීමට යාම තුලින් සිදුවන්නේ බොහෝ දෛනික වැඩකටයුතු අතපසු වීම සහ අසාර්ථක වීමයි. මේ නිසාම එවැනි පුද්ගලයින්ගේ රාත්‍රී නින්ද සුව දායකව ගත කිරිමට ඔවුන්ට නොහැකි වන අතර එසේම රාත්‍රී නින්දද ඔවුන්ට අහිමි වී රාත්‍රී කාලය පුරාත් බොහෝ වැඩ කටයුතු වල නිරත වීමට ඔවුන්ට සිදුවන අවස්ථා ඇත. මෙසේ වීම තුළින් නැවත උදාවන දිනයේ වැඩකටුයතු යලිත් අසාර්ථකත්‍වයට පත් වීමද සිදු වේ. මෙසේ දෛනිකව අසාර්ථක වීම තුළින් අවසානයේ දී සිදුවන්නේ පුද්ගලයෙකු වශයෙන් තම ජිවිත කාලය තුළ අසාර්ථක අයාලේ ගිය අයෙකු බවට පත් වීමයි.

අධ්‍යාපනය, වෘත්තීය, පෞද්ගලික ජිවිතය ආදි පුද්ගලයා හා බැඳුනු සියළු දේ තුල මනා විධිමත් සැලැස්මක් තැබිය යුතුයි. අපට ජිවිතය තුල යම් යම් දේවල් සඳහා කෙටි කාලීන මෙන්ම දිගු කාලීන ද සැලසුම් ගොඩනගා ගත යුතු වේ. කෙටි කාලීන සැලසුම් අපගේ ජිවිතයේ කෙටි කාලීන අරමුණු වලට ළඟා විමට උපකාරි වන අතර දිගු කාලීන සැලසුම් අපගේ ජීවිතයේ දිගු කාලීන අරමුණු වලට ළඟා වීමට උපකාරි වේ. මෙම සැලැස්ම වශයෙන් ගොඩනගා ගත් දේ යම් හේතු සාධක මත වෙනස් කිරීමට ජීවිතයේ සිදුවන අවස්ථා බොහෝ ඇත. එසේ නමුත් එවැනි අයුරින් වෙනස් කිරිමට හෝ ජීවිතයේ සැලැස්මක් තිබිම අත්‍යවශය කරුණකි.

අප සැලසුම් නිර්මාණය කරගත යුත්තේ අපගේ අවසාන ඉලක්ක මූලික කොටගෙනයි. යම් පුද්ගලයෙකුගේ අවසාන ඉලක්කය හා ඔහු වර්තමානයේ හදාරනු ලබන පාඨමාලා ගත් කල හාත්පස වෙනසක් දක්නට ලැබේ නම් එම පුද්ගලයාට එම අවිධිමත් වර්තමානය තුලින් අවසාන ඉලක්කය කරා ළඟා වීම දුෂ්කර වේ. අධ්‍යානපය හා අත්දැකිම් කුමක් හෝ වුවද අපගේ ජීවිතයට වැදගත් වේ. එසේ නමුත් මනා විධිමත් සැලසුමකින් තොරව ජිවිතය ගත කිරීමට යාම තුලින් අනාගත ඉලක්ක කරා යෑම කටුක වෙනවා පමණක් නොව සමහර විට බලාපොරොත්තු කඩ වීම තුලින් ජීවිතය සම්පූර්ණයෙන්ම බිඳ වැටී අයාලේ යාමට ඉඩ ඇත.

සැලැස්මක් වුවද ඒ තුළ මනා විධිමත් බවක් නොමැත්තේ නම් එවැනි සැලසුම් තුලින් සාර්ථක නිර්මාණ බිහිවන්නේ නැත. පුද්ගල ජීවිතය යනු නිර්මාණයකි. එය නිර්මාණය කරන මනා නිර්මාණ ශිල්පියා වන්නේ ද තමාය. මනා විධිමත් සැලැසමකින් තොර ජීවිතය අයාලේ යන බව නිර්මාණකරුවා මනාව වටහාගෙන තිබිය යුතු කරුණකි.

## ආදර්ශ රචනා 02

## විශ්වාස ඇදහිලි හා මත ද එක්තරා ආකාරයකට සමාජ ප්‍රගමනයට හේතු වේ.

මිනිසා යනු ස්වභාවයෙන්ම කුතුහලයෙන් පිරි සත්ත්වයෙකි. සූර්යයා, චන්ද්‍රයා පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති යුගයේදී එම ස්වභාවික වස්තු දේවත්වයෙන් සැලකූ මිනිසා ඒවාට වන්දනා මාන කිරීමට පටන් ගත්තේය. අද වන විටද අප්‍රේල් මස 13, 14 දින වල පවත්වන සූත්‍රය මංගල්‍යය, ශ්‍රී ලංකාව තුළද සූර්යය වන්දනාව පැවති බවට ප්‍රබල සාක්ෂියකි. එසේම අතීත ජපානයේ ප්‍රධාන ආගමක් බවට පත් වූ ෂින්ටෝ දහමේ ප්‍රධාන දෙවඟන වූයේ ද ''අමතේරසු ඔමි කමි'' නම් හිරු දෙවඟනයි. මෙසේ තමාගේ බුද්ධියට වටහා ගැනීමට නොහැකි වූ සූර්යයා, චන්ද්‍රයා වැනි ආකාශ වස්තූන්ට වන්දනා මාන කරනවා වගේම ගස්, වැල් පර්වත පිළිබඳ දේවත්වයෙන් සැලකූ මිනිසා එම ස්වභාවික වස්තූන්ට ද වන්දනා මාන කිරීමට ඈත අතීතයේ දි පෙළඹිනි.

විද්‍යාව හා තාක්ෂණයෙන් දියුණු වෙමින් සමාජය ඉදිරියට ගමන් කිරීමත් සමගම මිනිසාගේ පරිකල්පන ශක්තිය හා බුද්ධිය නම් වූ ළදරුවා ක්‍රම ක්‍රමයෙන් වැඩෙන්නට විය. එහි දි නව ආගමික දර්ශන රාශියක් ලොව තුළ හට ගැණුනි. අද වන විට ලෝකයේ වෙසෙන මිනිසුන්ගෙන් 99.99% ක් පමණ වූ පිරිසක් විශ්වාස කරන්නා වූ අදහන්නා වූ කුමන හෝ ආගමික දර්ශන මත වාදයක් පවතී.

මෙම විශ්වාස හා ඇදහිලි පුද්ගලයාගෙන් පුද්ගලයාට, සමාජයෙන් සමාජයට, රටින් රටට වෙනස් වන්නට බොහෝ සෙයින් ඉඩ ඇත. එසේ නමුත් සියළු දෙනාටම පොදු වූ කරුණක් නම් ඔවුන්ගේ විශ්වාසය මත ගොඩනැගුණු දර්ශනයක් මතවාදයක් ලොව තුල පැවතීමයි. මෙම ආගමික මතවාදයන් තුලින් ගොඩනැගි ඇති විශ්වාසයන් හි බොහෝ වෙනස්කම් ආගමෙන් ආගමට දක්නට ලැබේ. එක් ආගමක් දර්ශනයක් තුළ විශ්වාසය රඳවා ගත් පිරිසක් ඊළඟ භවයක් ඇතැයි පිළිගන්නා අතර තවත් ආගමක් දර්ශනයක් තුල විශ්වාසය රඳවා ගත්තා වූ පිරිසක් යහපත් මිනිසුන් මරණින් මතු දෙවියන්වහන්සේ කරා ගමන් කරන බව පිළිගනී. ඔවුන් දිගින් දිගටම ගමන් කරන්නාවූ භවය පිළිබඳ විශ්වාස නොකරයි. එසේම මිනිසුන් අදහන්නාවූ දෙවිවරු සහ ශාස්ත්‍රවරු ද එකිනෙකට වෙනස් වේ. එක් පුද්ගල කොට්ඨාශයක් අදහන්නා වූ දෙවියන්වහන්සේ නමක් හෝ ශාස්තෲන් වහන්සේ නම් තවත් පුද්ගල කොට්ඨාශයක් අදහන්නේ නැත. ඔවුන්ගේ විශ්වාසය වෙනත් දෙවියන්වහන්සේ නමක් හෝ ශාස්තාන්වහන්සේ නමක් පිළිබඳවය. මෙසේ විශ්වාස ඇදහිලි හා මත සමාජයෙන් සමාජයට පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

එසේ නමුත් මෙම සියළු විශ්වාස ඇදහිලි හා මත වලින් සිදු කරන්නාවූ මූලික වුත් පොදු වුත් ක්‍රියාව නම් මිනිසා පව් කිරීමට ලජ්ජා සහගත කිරීම සහ බිය සහගත කිරීමයි. මිනිසා යනු ස්වභාවයෙන්ම ඊර්ෂ්‍යා සහගත, ආත්මාර්ථකාමී, තණ්හාවෙන් යුක්ත සත්ත්වයෙක් වුවත් මෙම විශ්වාස ඇදහිලි හා මත තුලින් මිනිසා තුල පව් කිරීමට ලජ්ජාව හා බිය උපදවයි. ඒතුළින් තමාගේ ආත්මාර්ථකාමීත්ව, ඊර්ෂ්‍යාව හා තෘෂ්ණාව යම් තරමකින් හෝ මැඩ පවත්වා ගෙන කටයුතු කිරීමට මිනිසා පෙළෙඹේ.

මේ අයුරින් මිනිසාගේ ආත්මාර්ථකාමී, ඊර්ෂ්‍යා සහගත අදහස් යටපත් නොවුනහොත් මේ පෘථිවි තලය සියළු ජීවින්ට අනාරක්ෂිත භූමියක් බවට පත්වීම නියත කරුණකි. තමාගේ ස්වාර්ථය උදෙසා අන්‍යයන්ගේ ජීවිත වලට හානි කිරීම, අන්‍යන්ගේ දේපල සොරෙන් ගැනීම, මුසා බස් කීම මිනිසාට පොදු වූ සරල දෙයක් වනු ඇත. වනාශකාරී දේවල් ලොව පුරා ප්‍රචලිත කිරීමට පුද්ගල වශයෙන් කණ්ඩායම් වශයෙන්, රාජ්‍යයන් වශයෙන් උත්සහ දරනු ඇත. මන්ද මිනිසා යනු හුදෙක් ප්‍රචණ්ඩත්වයෙන් පිරි සත්ත්වයෙකි. මේ සියල්ල හෘද සාක්ෂියකට අනුව මැඩ පැවැත්වීමට හැකියාව ඇති එකම දෙය වන්නේ විශ්වාස ඇදහිලි හා මතයි. රටක නිති මාලාවක් පැවැත්ම මගින් රටේ සාමය ස්ථාපිත කිරීම සිදු වුවද නිතිය රඳා පවතින්නේ සාක්ෂි පදනම් කරගෙනය. පවට ඇති ලැජ්ජාව හා බියෙන් තොර වූ විට එම පුද්ගලයාට ප්‍රබල අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම පහසු වනු ඇත. එසේම නීතියද පුද්ගල අවශ්‍යතාවන්ට අනුව ගොඩනැගෙනු ඇත.

එසේනම් මේ අයුරින් විශ්වාස, ඇදහිලි හා මත තුළින් සමාජය දුරස් වූ විට සිදුවන්නේ ප්‍රබල පුද්ගල පරිහානියකි. එතුළින් සමාජයද පරිහානියට පත් වේ. මෙලෙස පරිහානියට පත් වූ සමාජයක් තුළ ප්‍රගමනයක් දක්නට නොලැබේ. එසේ නම් විශ්වාස, ඇදහිලි හා මත ද එක්තරා ආකාරයටසමාජ ප්‍රගමනයකට හේතුවන බව කිසිඳු තර්කයකින් තොරව පිළිගත යුතු කරුණකි.

## ආදර්ශ රචනා 03

## නූතන ජනමාධ්‍ය මානව චින්තනය සීමා කරයි.

''මනුස්ස'' යන්නෙහි අදහස උසස් මනසක් ඇති යන්නයි. ලොව වෙසෙන අනෙක් සත්ත්වයින්ට වඩා උසස් වූ මනසක් ඇති බැවින් අපට මනුස්ස යන නාමය ලැබී ඇත. ගින්දර සොයාගත් මිනිසාගේ සිට සඳ මතට පා තැබූ මිනිසා දක්වාම ඔවුන් ඒ තුල මෙහෙය වූයේ ප්‍රබල මානව චින්තනයයි. අලුත් අලුත් නිර්මාණ බිහි කිරීම, නව දැනුම හබායැම, සොබාදහම රස විඳීම ආදියට අතීතයේ පටන්ම මිනිසා උත්සුක වීමේ ප්‍රතිඵලයක් ලෙස බල්බය, රූපවාහිනිය, රේඩියෝව ආදී නව නිර්මාණ රාශියක් ලොවට බිහිවුණා පමණක් නොව නව විද්‍යාත්මක ගණිතමය සංකල්පද විශාල වශයෙන් ලොවට හෙලි කිරිමටම මිනිසාගේ ප්‍රබල මානව චින්තනය දායක විය. එදා සිට අද දක්වා වූ කාලය ගත් විට මෙම නව සොයාගැනීම් සහ නව සංකල්පයන්හි දායකත්වයෙන් ලොව විශාල වශයෙන් විද්‍යාත්මක තාක්‍ෂණික අතින් දියුණු බවට පත් වි ඇත.

මෙම නව සොයාගැනිම් අතරෙන් රූපවාහිනිය හා රේඩියෝව නූතනයේ ප්‍රධාන ජනමාධ්‍ය බවට පත් වී ඇත. මෙම නව සොයාගැනීම් ලොවට බිහිවූයේ ලෝකය එකම ගෝලීය ගම්මනයක් බවට පත් කොට ලොව ඉදිරි ප්‍රගමනය වේගවත් කිරීම සඳහායි. එසේ නමුත් වර්තමානයේදී, ජනමාධ්‍ය ළමා පරපුර මෙන්ම වැඩිහිටි පරපුර ද විශාල වශයෙන් ඇබ්බැහි වූ අංග බවට පත් වී ඇත.

නූතන අධ්‍යාපනඥයින්ට ප්‍රධාන ගැටළුවක් වී ඇත්තේ ළමා පරපුර තම ළමා අවදිය රසවිඳීමෙන් ඈත් වී යැමයි. ගණිතය, විද්‍යාව, භාෂාව, භූගෝලය ආදි විෂයන්ගෙන් පෝෂණය කරනවා මෙන්ම ළමා අවධිය කෙළි දොළෙන් රස විඳීමද අනාගතයේ බුද්ධිමත් මිනිසෙකු ලොවට දායාද වීමට අවශ්‍ය කරුණු වශයෙන් ඔවුන් වටහාගෙන ඇත. මේ වන විට පිංලන්තය වැනි රටවල් ද ළමයින්ට කෙළි දොළෙන් කාලය ගත කිරීමට අවස්ථාව ලබා දීම හා දැනුම ලබා දීම යන දෙකම ක්‍රියාවට නංවන නව අධ්‍යාපන ක්‍රම ලොවට හඳුන්වා දි ඇත. මෙවැනි අධ්‍යාපන ක්‍රම සාර්ථක බවත් එතුලින් බුද්ධිමත් මිනිසෙකු අනාගතයට දායාද වන බවත් ඔවුන්ගේ පිළිගැනීමයි. එසේ නමුත් අපගේ අවධානයට ගත යුතු ප්‍රබල කරුණක් නම් එවැනි වූ අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක නොවූවද ඈත අතීතයේ ප්‍රබල ගණිතඥයින්, විද්‍යාඥයින්, සංගිතවේදීන්, දක්‍ෂ ඉංජිනේරුවන්, නිර්මාණකරුවන් ලොවට බිහි වීමයි. එසේ නම් අද වන විට එවැනි වූ පුද්ගලයින් අනාගතයට බිහි කිරීමට නව අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය වීමට හේතුව කුමක්ද , එය ලෝකයේ බොහෝ දෙනෙක්ගේ අවධානයෙන් ඈත් වූ කරුණකි. මෙයට ප්‍රධානතම හේතුවක් වනුයේ නූතන මිනිසාගේ මානව චින්තනය සීමා වීමයි. නූතන මිනිසාගේ මානව චින්තනය සීමා කිරිමට නූතන ජනමාධ්‍ය අද වන විට ප්‍රබල මෙහෙවරක යෙදී සිටි.

දිනකට පැය අටක් වැනි කාලයක් නිදා ගැනීම මිනිසාගේ මනා සෞඛ්‍ය පැවැත්මට අත්‍යවශ්‍ය කරුණකි. ඉතිරි පැය අටක් වැනි කාලයක් අධ්‍යාපනය, වෘත්තිය ආදී කාර්යයන්හි නිරත වීමට මිනිසාට අවශ්‍ය වේ. තවත් දිනකට ඉතිරිවන්නේ පැය අටකි. මෙම ඉතිරි වූ පැය අටෙන් වැඩි කාලයක් රූපවාහිනිය අසල ගත කිරීම බොහෝ දෙනාගේ දින චර්යාවට පොදු වූ අංගයකි. නූතන ජනමාධ්‍ය තුලින් ඉදිරිපත් කරන ටෙලි නාට්‍ය, චිත්‍රපට ආදියට නූතනයේ මිනිසා බෙහෙවින් ඇලී තිබේ. මේ නිසා එකම අතර්ථ වූ රූපකායන්හි ක්‍රියාවන් දෙස දිනපතා බොහෝ වේලා දෑස් යොමා සිටින මිනිසාට තමන්ගේ චින්තන ශක්තිය දියුණ කර ගැනීමට අවස්ථාවක් උදාවන්නේ නැත. එසේම කාටූන්, චිත්‍රපට, ටෙලිනාට්‍ය වලට යොමු වීම තුලින් ළමා පරපුරට අහිමි වන්නේ තම සුන්දර වූ ළමා අවධිය ගත කිරීමට ඇති කාලයයි. අතීත මිනිසා නව දැනුම සොයා යමින් අලුත් දෑ අත්හදා බැලුවේය. වර්තමානය වන විට සියලු නව දැනුම රූපවාහිනිය, රේඩියෝව තුලින් ළඟා කර ගැනීමට ළමා පරපුර මෙන්ම වැඩිහිටි පරපුරද යොමු වී සිටී. මේ තුලින් සිදුවන්නේ මිනිසාගේ බුද්ධි කලම්බනය අඩු වී මානව චින්තනය සීමාවීමයි. අතීතයේ මිනිසාට සොබාදහම රස විඳීමට අවශ්‍ය වූ විට ඔවුන් නව දේශයන් වල පවා සංචාරයේ යෙදුණහ. ගස්වැල්, ඇල දොළ, ගංගා, සාගර, පර්වත ඔවුන්ගේ නෙත් වලින් තාත්විකව බැලීමෙන් පමණක් නොව සුළඟ පවා ස්පර්ශ කිරීමෙන් රස වින්දහ. එසේ නමුත් අද වන විට බොහෝ දෙනෙකුට පොදු වූ කරුණක් නම් එම රූපවාහිනි වැඩසටහනේ කණ්ඩායම පමණක් එම අපූරු අත්දැකීම සොයාගෙන ගමන් කිරීම සහ අනෙක් පිරිස එය රූපවාහිනිය තුලින් රස විඳීමයි. එසේ වූ විට සොබා දහම හා බැඳුනු මිනිසෙකු ඒ තුලින් කෙසේ බිහිවන්නේද සොබා දහමින් ඈත් වූ මිනසාගේ මානව චින්තනය

## ආදර්ශ රචනා 04

## සේවක අභිප්‍රේරණය ඵලදායිත්ව ඉහළ නංවයි.

සේවා දායකයින් තුළ ඇති විවිධ හැකියාවන්, කුසලතාවන් හා නිර්මාණශීලී අදහස් තුලින් යම් ආයතනයකට උපරිම සේවාවක් ඉටුවන අයුරින් උද්යෝගයෙන්, උනන්දුවෙන් හා තෘප්තිමත් මනසකින් යුක්තව සේවයේ යෙදීමට සේවකයා පෙළඹවීම තුලින් ආයතනය වෙත පැමිණෙන සේවා ලාභීන් වඩාත් තෘප්තිමත් භාවයට පත් කළ හැක.

සේවක අභිප්‍රේරණයෙහි ලා එකිනෙකාගේ අවශ්‍යතා මෙන්ම හැකියාවන් හදුනාගැනීමද ඉතා වැදගත් වේ. ආයතනයක ප්‍රධානියාගේ අභිමතය පරිදි වැටුප් වර්ධක, ප්‍රශංසා, උසස්වීම්, දිරි දීමනා, වරප්‍රසාද වැනි ධනාත්මක පිවිසුම් හෙවත් යම් යම් ප්‍රතිලාභ ලබාදීම තුලින් මෙන්ම අවවාද කිරීම, තර්ජනය කිරීම, දඩ ගැසීම, තනතුරින් පහල හෙලීම වැනි සෘණ පිවිසුම් හෙවත් දඩුවම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුලින්ද සේවකයන්ගේ ආයතනික අවශ්‍යතා ඉටුකරවා ගත හැක.

අතීතයේදී මූල්‍යමය ප්‍රතිලාභ තුලින් වැඩි අභිප්‍රේරණයක් සිදුවන බව පිළිගෙන තිබිණි. ඒ අනුව වැඩ කළොත් පමණක් හෝ වැඩ කරන ප්‍රමාණයට පමණක් ගෙවීම කෙරෙහි වැඩි ප්‍රවනතාවයක් තිබිණි. එමෙන්ම මුදල්වල අභිප්‍රේරණ බලය වැඩි බවට ප්‍රබල විශ්වාසයක් නූතනයේ පවා කළමනාකරුවන් අතර තහවුරු වී ඇත. එහෙත් සේවකයාගේ මානසික අවශ්‍යතා හා මානසික තෘප්තිය අභිප්‍රේරණය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම බලපානු ලබන බව වර්තමානයේ වැඩි ප්‍රතිශතයකගේ පිළිගැනීම වී ඇත.

මූල්‍යමය ප්‍රතිලාභ ගණයට ගැනෙන වැඩි වැටුප් වැටුප් වර්ධක, ණය පහසුකම් හා දිරි දීමනා අභිප්‍රේරණයට බලපාන එක් සාධකයක් පමණි. මේ තුලින් සේවා දායකයාගේ සියළු අවශ්‍යතා සපුරාලිය නොහැක. ඔවුන්ට පුහුණු අවස්ථා ලබාදීම තුලින් වෘත්තිමය හැකියාවන් වර්ධනය කිරීම, රැකියා සුරක්ෂිතභාවයක් ඇති කිරීම, නිරවුල් මනසකින් රැකියාවේ නිරතවිය හැකි පරිසරයක් ගොඩනැගීම, සේවකයින් හට සුභ සාධක පහසුකම් ඇති කර දීම, බලය විමද්‍යගත කිරීම තුලින් ඔවුන් වෙත වැඩි වගකීම් ප්‍රමාණයක් පැවරීම, සේවකයා ආයතනයේ කොටස් කරුවකු ලෙස සැලකීම, සේවක නිදහස, යහපත් අන්තර් පුද්ගල සබඳතා හා කණ්ඩායම් හැඟීම් ගොඩනැගීම තුලින් අභිප්‍රේරණය නිරායාසයෙන්ම ඇති වේ.

අභිප්‍රේරණය වූ සේවා දායකයින් සිටින ආයතනයක් තුල ඉතා උසස් සේව්‍ය සේවක සබඳතාවයක් නිතැතින්ම ගොඩනැගේ. සේවකයා ආයතනය කෙරෙහි දක්වන ඇල්ම වැඩි වේ. සේවකයා තුල සැඟව ඇති විශේෂ දක්ෂතා , කුසලතා මෙන්ම නිර්මාණශීලී අදහස් ආයතනයේ උන්නතිය උදෙසා ප්‍රයෝජනයට ගත හැකිවා මෙන්ම සේවා දායකයා තුල සැඟව ඇති වැඩ කිරීම් ධාරිතාවක් වෙත්නම් එයද ප්‍රයෝජනවත් වනු ඇත. සේවා දායකයාගේ සේවා ලැදිකම තුලින් සීමිත සම්පත් ප්‍රමාණයකින් උපරිම ඵල නෙලාගැනීමට හැකි වනු නිසැකය. ආයතනයක අරමුණු හා පරමාර්ථයන් ඉටුකර ගැනීමේදී මේ තුලින් සාර්ථක ප්‍රතිඵල අත්වනු ඇත.

මෙසේ සේවකයින් විවිධ අයුරින් තෘප්තිමත් කිරීම තුලින් සේවක අභිප්‍රේරණය ඇති වනවා මෙන්ම එය නොදැනීම ආයතනයේ අභිවෘද්ධිය කෙරෙහිද බලපායි. මේ තුලින් ආයතනය විසින් සපයනු ලබන සේවාවන් වඩාත් ඵලදායි වනු ඇත. සේවා ලාභීන්, තෘප්තිමත් වනවා මෙන්ම ආයතනයට ආර්ථිකමය වාසි රැසක්ද අත්වනු ඇත. සේවක අභිප්‍රේරණය ආයතනයක ඵලදායිතාවය ඉහල නැංවීමෙහි ලා සෘජුවම බලපානු ලබන සාධකයක් බව මේ අනුව තහවුරු වේ.

## ආදර්ශ රචනා 05

## ජනමාධ්‍ය මානව චින්තනය සීමා කරයි.

ජනතාව තොරතුරු දැනගන්නේ ජනමාධ්‍ය තුලිනි. එහෙයින් ජනමාධ්‍යට පැවරී ඇති වගකීම හා කාර්යභාරය අතිමහත්ය. රටක් එකමුතු කිරීමට මෙන්ම රටක් බෙදා වෙන් කිරීමටද ජනමාධ්‍ය බොහොසේ බලපායි. ජනතාව සෑම විටම ජනමාධ්‍ය සත්‍යය යැයි සලකා තීරණයන්ට එළඹීමට පුරුදු වී සිටිති. එතරම්ම මිනිසාගේ සිත් ජනමාධ්‍ය කෙරෙහි ඇදී ගොස් ඇත. ජනසමාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කරන තොරතුරු මිනිසාගේ සිත් තුලට කාවදින බැවින් එහි සත්‍ය අසත්‍ය භාවය සොයා නොබලාම විශ්වාස කිරීමට පවා වර්තමානයේ ජනතාව පෙළඹී ඇත.

නූතන ජනමාධ්‍ය වර්ග මෙන්ම ජනමාධ්‍ය ආයතනද බොහෝය. එහෙත් ඒ අතුරින් ඇතැම් ජනමාධ්‍ය තම වගකීම හරි හැටි හඳුනාගෙන නැත. හුදෙක් ආර්ථිකමය වාසි පිළිබඳව පමණක් සලකමින් යම් තැනක සුළු අඩුපාඩුවක් ඇති වුවද එය හුවා දක්වමින් එයටම දිගින් දිගටම පහර ගසමින් එම අදහසම ජනතාවගේ සිත් තුලට කා වද්දමින් ජනතාව කුපිත කරවමින් ක්‍රියා කිරීම ඔවුන්ගේ පුරුද්දක් කරගෙන ඇත. මෙසේ එකම දේ පුන පුනා කියමින් නන් අයුරින් විටින් විට එයම ඉදිරිපත් වන විට ජනතාවද කිසිඳු වග විභාගයකින් තොරව එයම විශ්වාස කරනු ලබයි.

ඇතැම් අපරාධ, මංකොල්ලකෑම්, කාම අපරාධ ආදිය විවිධ අයුරින් මතුකර දක්වමින් ඇතැම් ජනමාධ්‍ය ආයතන මිනිසාගේ මනස විකෘති ආශාවන්ගෙන් පිරවීමට කටයුතු කරනු ලැබේ. ජනතාව ඔවුන් වටා ඇද බැඳ තබා ගැනීමේ අරමුණින් ජනමාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කිරීමට පවා නුසුදුසු ඇතැම් කරුණු රසකරකර ඉදිරිපත් කරති.

ජනමාධ්‍ය අතර ඇත්තේ තරගයකි. එහෙයින් ඔවුන් රසිකයන්ගේ සිත් ආකර්ෂණය කල හැකි රසිකයා පිනවිය හැකි කුමන හෝ පිළිවෙතක් අනුගමනය කිරීමට පෙළඹී ඇත. මෙසේ දවස පුරා විවිධ ජනමාධ්‍ය ඇසුරෙහි කල් මරණ මිනිසා නිගමනයන්ට එළඹීමේදී සත්‍ය අසත්‍ය භාවය කෙරෙහි කරුණු සොයා බැලීමකින් තොරවම ජනමාධ්‍ය ඔස්සේ සිත් තුලට කාවද්දා ඇති දේ සත්‍යමැයි පිළිගෙන කටයුතු කරනු බොහෝ අවස්ථා වල දක්නට ලැබේ. ජනමාධ්‍ය වලින් වැඩි ප්‍රතිශතයක් පාඨකයාට සිතීමට කිසිඳු ඉඩක් නොතබාම සිය අදහස් ඔවුන්ගේ මනසේ පැලපදියම් කිරීමට සමත්ය. රටේ ලෝකයේ පවතින ආර්ථිකමය හා දේශපාලනික තත්වය භූගෝලීය කාලගුණික හා දේශගුණික තත්වය පිළිබඳව නිවැරදි කරුණු හෝ අදහස් රසිකයා වෙත ඉදිරිපත් නොකර වැදගත් කමින් අඩු අනවශ්‍ය කරුණු අතිශෝක්තියෙන් ඉදිරිපත් කර හුවා දක්වමින් ජනමාධ්‍ය සිය වාණිජමය අභිලාශයන් පමණක්ම ඉටු කර ගැනීමට යත්න දරයි. අර්ථ ශූන්‍ය නාට්‍ය, පුවත්පත් වාර්තා ආදිය ඉදිරිපත් කරමින් ජනතාවගේ සිත් සමාජීය ප්‍රශ්න පිළිබඳව යොමුවීම වැලැක්වීමට පවා ජනමාධ්‍යයට අති විශාල හැකියාවක් ඇත.

වර්තමානයේ මිනිසා ජනමාධ්‍ය කෙරෙහි ඇති වී ඇති ඇබ්බැහි වීම හේතුවෙන් රොබෝ වරුන් බවට පත්වෙමින් සිටිති. කාර්යයක් කිරීමට හෝ නිගමනයකට එළඹීමට විධානයක් අත්‍යවශ්‍ය වී ඇත. සෑම කාරණයක් පිළිබඳවම බුද්ධියෙන් විමසා කටයුතු කිරීමට පෙළඹවීම ජනමාධ්‍යවල වගකීම වුවද සිය අභිමතාර්ථයන් ඉටුකර ගැනීම උදෙසා මානව චින්තනය සීමා කිරීමට නූතන ජනමාධ්‍ය පෙළඹී ඇති බව පිළිගත යුතු සත්‍යයකි.

## ආදර්ශ රචනා 06

## ආගම ජීවිතයට ගහට පොත්ත මෙනි.

අවුරුදු දෙදහස් පන් සියයකටත් වැඩි අතීත සංස්කෘතියකට උරුමකම් කියන අපි එකල සිටම ආගමික කටයුතු කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වූවෙමු. බුදු දහමේ මෙන්ම අන්‍ය ආගම්වලින්ද දැහැමි දිවි පෙවතක් කෙරෙහි සියල්ලෝ යොමු කරති. ගොවිතැන, වෙළඳාම, සත්ව පාලනය මෙන්ම තමා නියැලෙන රැකියාව රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වුවද, වෙනත් ස්වයං රැකියාවක් වුවද එය ධර්මානුකූලව සිදු කිරීම අගනේ යැයි අපි ඉගෙන ගෙන ඇත්තෙමු. තවද ජීවත් වන කාලය තුල සිදු කරන කුමන කටයුත්තකදී වුවද ආගමික වතාවත් පෙරදැරි කර ගැනීම අපි පුරුද්දක් කරගෙන සිටිමු. ඈත අතීතයේ සිටම මිනිසා දැහැමෙන් උපයාගත් ධනයෙන් අඹුදරුවන් රකිමින් ධර්මානුකූල ජීවිත ගතකල බව ඉපැරණි සාහිත්‍ය ග්‍රන්ථ වලින් පවා පැහැදිලි වේ.

තමා අදහන ආගම කුමක් වුව එම ආගමේ දර්ශනයෙන් කියවෙන පරිදි සියල්ලෝ ආගමානුකූල ජීවිත ගත කරන්නේ නම් එය රටට මෙන්ම සමාජයටද කරනු ලබන මෙහෙවරකි. ප්‍රාණඝාතය, අනුන් සතුදේ සොරකම් කිරීම, බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, විවිධ සමාජ අපචාර හා දූෂණවල නියැලීම, නීති විරෝධි ක්‍රියාකාරකම්, නීති විරෝධි ඉපැයීම් ආදියෙන් බැහැරව වාසය කරන්නැයි සියළුම ආගම් වලින් කියවේ. මිනිසා මෙම සමාජ විරෝධි ක්‍රියාවන්හි යෙදෙන්නේ නම් එය සමාජයට පමණක් නොව තමාටද සිදුකර ගන්නා හානියකි. වර්තමානයේ ජීවත් වන මිනිසා මේ පිළිබඳව තැකීමක් ඇතැයි බොහෝ විට දක්නට නොලැබේ. මෙවැනි කටයුතු තුලින් දුකක් මිස කිසිදා සැපක් ඇති නොවන බව කියවෙන ආගමික මතය සාක්ෂි ඇතිව අප ඉදිරියේ ඔප්පු වී ඇත. එක් ක්‍රියාවන්හි නියැලෙන්නන් සමාජය ඉදිරියේ අපහාස විදිනවා මෙන්ම ජීවිත වලින් පවා වන්දි ගෙවන අවස්ථා බොහෝය.

අප විසින් සිදු කරන සෑම කාර්යයක් සඳහාම නිවරදි මග ආගම් තුලින් පෙන්වා දී ඇත. වැඩිහිටියන්ට හා අසරණයින්ට පිහිටවීම, කෙනෙක් රෝගී වූ විට හෝ අන් අයගේ උදව් අවශ්‍යය අවස්ථා වල ඔවුන්ට පිහිටවීම නිරායාසයෙන් අප අතින් සිදුවන්නකි. මෙවැනි අවස්ථාවල අදාල පුද්ගලයා තමා දන්නා හඳුනන අයෙකු වුවද, නොවුවද අපි උදව් කිරීමට පෙළඹෙන්නෙමු.

තවද දානමාන දීම, ආගමික වතාවත් සිදු කිරීම, ආදිය වුවද හුදෙක් ආගමික කටයුත්තක් සේ නොසලකා ඒවා අප විසින් සිදුකල යුතු දේවල්ම යැයි දැනෙන තරමට අපි ආගමික වතාවත් කෙරෙහි බැඳී සිටින්නෙමු. ආගමික නායකයින්ට ගරු කරන්නෙමු. ආගමික සිද්ධස්ථාන හා ඒවාට අයත් දේපල ආරක්ෂා කරන්නෙමු. වැඩි දියුණු කිරීමට උපකාර කරන්නෙමු.

සමහර අවස්ථාවල ජීවිතයේ ඇතිවන නොයෙක් ගැටළු වලදී මෙන්ම රටක් පාලනය කිරීමේ දී රාජ්‍ය නායකයන් පවා විවිධ ආගමික නායකයන් හමු වී උපදෙස් ලබාගන්නා අවස්ථා ඇත. මෙය වසර දහස් ගණනකට පෙර අතීතයේ සිටම පැවත ආවකි.

මේ අනුව ආගම ජීවිතයේ බොහෝ කටයුතු වලට බලපානුයේ නිරායාසයෙනි. වර්තමානයේ පෘථිවිය තුල ජීවත් වන සෑම ජන කොට්ඨාසයක්ම පාහේ කුමන හෝ ආගමක් අදහති. එහෙයින් ජීවිතය හා ආගම අතර ඉමහත් වූ බැඳීමක් පවතින බව අවිවාදයෙන් පිළිගත යුත්තකි.

## ආදර්ශ රචනා 07

## මනා විධිමත් සැලසුමකින් තොර ජීවිත අයාලේ යයි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම මනුෂ්‍යයින් විසින් ඔවුනොවුන්ගේ සංස්කෘතිය, ආගම් දර්ශන ඔස්සේ මග පෙන්වා ඇති ජීවන රටාවට අනුගත වෙමින් සිය ජීවිත පවත්වාගෙන යනු ලබන්නේ වර්තමානයට වඩා බෙහෙවින් සුඛිත මුදිත වූ අනාගතයක අපේක්ෂා පෙරදැරි කර ගනිමිනි. අතීතයට සාපේක්ෂව වර්තමානය, තාක්ෂණය වඩාත් සිය ජීවන රටාවට ආකර්ශනය කරගත් නිම් හිම් නොපෙනෙන තරඟයකට නිරායාසයෙන්ම නිරතුරුවම යොමු වූ මිනිසුන් බිහි කර ඇත්තේ සිය අසීමිත අවශ්‍යතා සීමිත සම්පත් වලින් සපුරා ගැනීමට සිදුව ඇති බැවිනි. අද්‍යතනයේ මෙම තරඟය අතීතයේ දෘශ්‍යමාන වූයේ සීමිත මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට වුවත් නූතන සමාජයේ තරඟය නමැති අභියෝගය තරණය කිරීමට සමත් වන්නන්ගේ ශක්‍යතාවය මත සිය ජීවිත වල සාර්ථකත්වය තීරණය වන නිසාවෙන්ම අපේක්ෂිත අරමුණු වෙත ජීවිත මෙහෙයවීම සඳහා දැඩි පරිශ්‍රමයක් දැරිය යුතුය. බාල, තරුණ, මහළු යන කවර වයස් සීමාවකදී වුවත් අප වෙත පැවරී ඇති කාර්යභාරයන් සඵල කර ගැනීම සඳහා තිරසර අදිටනින් කටයුතු කළ යුතුය. අධ්‍යාපනය විසින් දායාද කරනු ලබන දැනුමෙන් සහ ආගම් දර්ශන තුළින් උපයා ගත් සාර ධර්ම අනුසාරයෙන් මිනිස් ජීවිතය පෝෂණය වේ. ආගමානුකූලව ජීවන රටාව පවත්වා ගැනීමට උත්සාහ දැරීම මගින් ජීවිතය නිසරු බවට පත්වීම වැළැක්විය හැක.

උපතේ සිට මරණය දක්වාම අතිශය කාර්යබහුල ජීවිතයක් ගත කිරීමට නූතන මානවයාට සිදු වී ඇති බැවින් ආගමික වත් පිළිවෙත්හි යෙදීමට වෙන් කළ හැකි කාලය සීමා සහිත වී ඇති අතර එනිසාම අධ්‍යාත්මික ශික්ෂණයද අඩාල වී ඇත. අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකුට සිය අධ්‍යාපන කටයුතු ජයග්‍රාහී ලෙස සාර්ථකව අවසන් කළ හැක්කේ නියමිත ඉලක්කය වෙත සිය සිසු ජීවිතය මෙහෙයවීමෙනි. ඒ සඳහා බාහිර බාධාවන් මැඩගෙන සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. මන්දයත් මනස විකෘති කරවන දුරාචාරයන් ගහණ සමාජයක් ස්ථාපිතව ඇති බැවිනි. නූතන තාක්ෂණික දියුණුවේ අනිටු ඵල විදහා දක්වමින් ජනමාධ්‍ය අන්තර්ජාලය වැනි ඇසි දිසි මාධ්‍යයන් ඔස්සේ ආගමික සංස්කෘතික හැදියාවන් වර්ධනය හීන කරවනු ලබයි. හරි මග තෝරාගෙන සංයමයෙන් යුතුව එහි ගමන් කළ යුතු නමුත් මංමුලාවූවකුගේ තත්වයට පත් වුවහොත් මුළු මහත් අනාගතයම අඳුරු වීමට ගත වනුයේ නිමේෂයකි.

සිසු ජීවිතය නිමා කර ජීවන අරගලයේ මීළඟ ඉලක්කය වන රැකියා ක්ෂේත්‍රයක් තුළට පිවිසෙන මිනිසා එම රැකියාවේ ව්‍යවස්ථාපිත රෙගුලාසි මාලාව අනුව ඊට අනුගත වෙමින් සිය වෘත්තිය ජීවිතය පවත්වාගෙන යා යුතුය. තමන් වෙත පැවරෙන සියළුම කාර්යභාරයන් මනාව ඉටුකොට තෘප්තිමත් වෘත්තිකයෙකු විය හැක්කේ විධිමත් සැලසුම් ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත රාජකාරි වඩාත් ඵලදායි ලෙස ඉටු කිරීමෙනි. යම් හෙයකින් රාජකාරි කටයුතු අතපසුවීමක් සිදු වුවහොත් දිගින් දිගටම රාජකාරි කටයුතු ගොඩගැසුණු අවස්ථාවකදි නිරවුල් මනසකින් කටයුතු කිරීම අපහසුය. රැකියා ස්ථානයේදී දෝෂ දර්ශනයට ලක් වන වෘත්තිකයෙකුට සිය මානසික පීඩාව රැකියා ස්ථානයට පමණක් සීමාවනු දැකිය නොහැක. අවුල් සහගතව රැකියා ස්ථානයෙන් පිටවන ඔහු සිය නිවස වෙත පිය නගනුයේද මානසික පීඩාවෙන් යුක්තවමය. ගෘහ ජීවිතයේ කටයුතු පවා අඩාල වීමට හැකියාව ඇත්තේ ගෘහ ජීවිතයත් වෘත්තීය ජීවිතයත් එකිනෙක මත රඳා පවතින බැවිනි. කිසියම් වරදකින් රැකියාව අහිමිවන අයෙකු වුවද කෙසේ හෝ ජීවිතය පවත්වාගෙන යා යුතුය. ඒ වෙනුවෙන් වැරදි මාර්ගයක් වෙත යොමු වීමට පවා අවකාශ සලසනුයේ රැකියාව අහිමි වීමත් සමඟම එම පුද්ගලයා වැළඳගනු ලබන සමාජ ආර්ථික ප්‍රශ්නාවලියකි. මනාව සංවිධානාත්මක ජීවිකාව පවත්වාගෙන යාමට උත්සාහ දැරීමෙන් වෘත්තීය අභිවෘද්ධිය සලසාගත හැකිය.

ගෘහ ජීවිතයේ ප්‍රමුඛ ආයතනය වශයෙන් සැලකෙන පවුල් ඒකකය දෙස අවධානය යොමු කළ විට කිසියම් පවුලක් සාර්ථක සමාජ පසුබිමක් තුල ස්ථාපිතව ඇත්නම් එම පවුලේ සියළුම සාමාජිකයන් මනා සමාජානුයෝජනයෙන් යුක්තව ඇති බව දක්නට ලැබේ. එකිනෙකා කෙරෙහි දක්වන ගෞරවයට, ආදරයට පදනම් වනුයේ සිය යුතුකම් වගකීම් ඉටු කිරීමෙහි ලා දක්වන ශක්‍යතාවයයි. පවුල මනාව පවත්වාගෙන යාමට නම් ආර්ථික, සංස්කෘතික හා ආගමික රාමු අනුව එය සංවිධානය කළ යුතුය. පවුල් ඒකකයක ආර්ථික තත්වයට ගැලපෙන ලෙස පවුලේ සාමාජිකයන් ප්‍රමාණය සැලසුම් නොකළහොත් එය එම පවුලේ පරිහානියට මෙන්ම රටටද බරක් වීමට හේතු සාධක වේ. පවුල සැලසුම් කිරීම මගින් පවුලේ සාමාජිකයන් සියළු දෙනාගේම ජීවිත සඵල කිරීමට කටයුතු සැලසේ. පවුලේ සාමාජිකයන්ගේ සියළු දෙනාගේම අවශ්‍යතා මනා ලෙස පූර්ණය වන විට ඉන් බිහිවන්නේ තෘප්තිමත් මනසකින් යුතු සමාජය දෙස සුභවාදීව නෙත් හෙළන පිරිසකගෙන් යුත් ඒකකයකි.

පවුල් ඒකකය තුලින් සමාජයට පිවිසෙන මානවයා සිය පවුල් ඒකකය තුලින් ලබාගත් හැදියාව, ආකල්ප සහ සංහිඳියාව සමාජ සංස්ථාව තුලම පතුරුවා ලීමට කටයුතු කරයි. මනා දැනුමෙන්, අධ්‍යාත්මික ගුණ වගාවෙන් පෝෂිත ජීවන රටාවක් උරුම වූවෙකු කිසි විටෙකත් අයාලේ නොයයි. ජීවිතය සැලසුම් කිරීම පවුල් සංස්ථාව තුලින්ම ආරම්භ කල යුත්තේ එහෙයිනි. දිනෙන් දින වර්ධනය වන ජීවන ගමන් මග තරග බිම ජය ගැනිම සඳහා අප ජීවිත විධිමත් සැලසුම් ඔස්සේ මෙහෙයෙවිය යුතුය. සමාජ සංවර්ධනයට උර දෙමින් ජීවිතය ජය ගැනීමේ ඒකායන මාර්ගය මනා විධිමත් සැලසුම් සහගත ජීවන රටාවක් උරුම කර ගැනීම වේ.

## ආදර්ශ රචනා 08

## නූතන ජනමාධ්‍ය, මානව චින්තනය සීමා කරයි.

නවීන තාක්ෂණික දියුණුවෙහි අසිරිමත් පෙළහර විදහා දක්වන ප්‍රමුඛ ඉසව්වක් වශයෙන් නූතන ජනමාධ්‍ය හඳුන්වා දිය හැකිය. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එදිනෙදා සිදුවන ඕනෑම සිදුවීමක් එසැනින් ආවරණය කිරීමට සමත්කම් දක්වන ජනමාධ්‍ය අද්‍යතන මිනිසාට අත්‍යවශ්‍යම අංගයක් බවට පත් වී හමාරය. මිනිසා සවිඥාණිකව බල ගැන්වීමේ අදහස පෙරදැරි කරගනිමින් ක්‍රියාත්මක වන නූතන ජනමාධ්‍ය ජනතාව වෙත වඩාත් වේගයෙන් නිවැරදි තොරතුරු ලබා දීම සඳහා විවිධ ජනමාධ්‍ය ආයතන හරහා නිරන්තර තරගයක යෙදී සිටිති. මිහිපිට මෙන්ම ඈත අභ්‍යවකාශයේ වුවද ඕනෑම මොහොතක සිදුවන වෙනස්වීමක් නෙතුමානයෙහි සජීවී දර්ශනය කර ගැනීමේ දුර්ලභ භාග්‍යය අප වෙත උදා වී ඇත්තේ නූතන ජනමාධ්‍යයන්ගේ ආනුභාවයෙනි.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම එහි ක්‍රමික විකාශනයට හේතුපාදක වූයේ නව තොරතුරු දැන ගැනීමට හා අළුත් අළුත් දෑ නිපදවීමට මිනිසා තුළ වූ කුතුහලයයි. අතීතයේදී මිනිස් අවශ්‍යතා සාපේක්ෂව සීමිත වූ බැවින් ඒවා සපුරා ගනිමින් නව ලෝකයක් වෙත පිය නැගුමට මිනිස් සිත ඇදී ගියේ නිරායාසයෙනි. විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ දීර්ඝ ගමනක යෙදුණු මිනිස් චින්තනය ලෝකයේ ශ්‍රේෂ්ඨ සංස්කෘතීන්, ආගම් දර්ශන බිහි කරලීමට පුරෝගාමී විය. බෞද්ධ දර්ශනයට අනුව බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ තමා විසින්ම ලෝකයේ සියළු තතු අතැඹුලක් සේ දැනගත් බැවිනි. බුදුන් වහන්සේ සිත දියුණු කළ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකු බව අවිවාදයෙන් යුතුව දැක්විය හැකිය.

බෞද්ධ සංස්කෘතියේ සාරධර්මයන්ට අනුකූලව සිය ජීවන රටාව සකසා ගත් ශ්‍රී ලාංකික සමාජයේ අතීත කාල වකවානුව විග්‍රහ කළහොත් පන්සල කේන්ද්‍ර කර ගනිමින් සරල දිවි පෙවතක් ගත කළ අල්පේච්ඡ සමාජයක් වශයෙන් දැක්විය හැකිය. ගොවිතැන ජීවිකාව කර ගත් එදා ගැමියා සිය ගොවිතැන් කටයුතු අවසන් කර සන්ධ්‍යා කාලයේ දී පන්සල වෙත පිය නැගුවේ දහම් සිසිලෙන් තම ජීවිත සනහා ගැනීම සඳහාය. බණ දහම් ඇසුමෙන් ලබාගන්නා ලද අධ්‍යාත්මික ශික්ෂණය අනුසාරයෙන් ලොව පුදුමකරවන මහ වැව්, මහා දාගැබ් නිර්මාණය කරලීමට සමත් වූවෝය. එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවලදී සිය කාන්සිය මගහරවා ගැනීමට පවා ඔවුන් සිතුවේ කවියක්, ගීයක් ගායනය කිරීමෙනි. මෙලෙස ජන දිවිය ඇසුරෙන් නිර්මාණය වූ ජනකවි එදා ගැමියාගේ සාහිත්‍ය රුචිකත්වය පිළිඹිබු කරයි. පන්සල වටා රොක් වූ ගම්වාසීන් ඔවුනොවුන්ගේ තොරතුරු දැනගැනීමටත් ඒ අනුව එකිනෙකාට සහයෝගය ලබාදීමටත් ක්‍රියා කළ අතර අන්‍යෝන්‍ය සුහදතාවය, වර්ධනය වූ සමාජයක තෘප්තිමත්ව දිවි ගෙවීමට වරම් ලැබූහ.

තාක්ෂණික දියුණුවත් සමගම වඩාත් සංකීර්ණ අවශ්‍යතාවයන්ගෙන් යුතු වූ මිනිසාට ක්‍රමයෙන් පන්සල වෙතින් ඈත් වන්නට සිදු වූ අතර වර්තමානයේදී බණ ඇසීම වැනි කාර්යයකට පවා පන්සලට යාම අවශ්‍ය නොවනුයේ ජන මාධ්‍යයන් ඔස්සේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට අවස්ථාව සැලසී ඇති බැවිනි. නොයෙකුත් විවිධ කාර්යයන්හි නිරත වන අතරම ඇසිදිසි මාධ්‍යයන් ඔස්සේ බණ ඇසීමට හැකි වූවත් එහිදී මානසික ඒකාග්‍රතාවය කෙතරම් දුරට සුරක්ෂිතද යන්නට හෘද සාක්ෂිය සාක්ෂි දරනවා ඇත. ලෝකයේ ඈත කොණක ජීවත් වන පුද්ගලයෙකුගේ තොරතුරු ජනමාධ්‍ය ඔස්සේ දැන ගන්නා මිනිසා බොහෝ විට සිය අසල්වැසියාගේ තොරතුරු නොදන්නා තරම්ය. ඕනෑම දෙයක් පිළිබඳව තථ්‍ය අයුරෙන්ම වාර්තා වන බැවින් හා ඒවා සියැසින් දැක ගැනීමට හැකි වන නිසා ඒ සම්බන්ධයෙන් තව දුරටත් සිතා බැලීමට කිසිවක් ඉතිරි වී නොමැත. මේ නිසා අළුත් නිර්මාණයක් බිහි කරලීමට ඇති මං අවුරාලනු ඇත. අළුත් දෙයක් සිතීමට වෙහෙසක් නොදරන මානවයා සිය චිත්ත ශක්තිය නිසි ලෙස භාවිතයට නොගනී.

නවතම නිර්මාණයක රස විඳිනු වෙනුවට ලොව වෙනත් සංස්කෘතියක රූප පෙළහර නැරඹීමට ජනතාව හුරු පුරුදු වීම තුළ සංස්කෘතික වශයෙන් පරිහානියක් ඇතිවිය හැකිය. ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට පටහැනිව ක්‍රියා කරන ජනමාධ්‍යවේදීන් පවා දැක ගැනීමට හැකි නිසා මිනිස් සිතෙහි ආවේලශීලී හැඟීම්, අශ්ශීල හැඟීම් ඇති වීමට නැඹුරුතාවයක් ඇති විය හැක. ජනමාධ්‍ය අනිසි භාවිතයෙන් සමාජ අවගමනයට මං සැලසේ. යම් කිසිවක් සම්බන්ධයෙන් සමාජයේ මුල් බැසගෙන ඇති ආකල්පයන් සැණින් වෙනස් කර විශාල විප්ලවයක් සිදු කරලීමේ අද්විතීය බලයක් ජනමාධ්‍ය සතුවන බැවින් එහි ශක්තිය යොදා ගත යුත්තේ සමාජයේ යහපැවැත්ම උදෙසාමය. සාහිත්‍යය ක්ෂේත්‍රය ගෙන හැර බැලුවහොත් නව නිර්මාණ බිහි කළ හැකි නිර්මාණාත්මක හැකියාවන්ගෙන් යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ගේ දස්කම් එළි දැක්වීමට අත හිත දීමක් ජනමාධ්‍ය ඔස්සේ සිදු කළ හැකිය. මානව චින්තනය ප්‍රවර්ධනය උදෙසා ක්‍රියා කළ හැකි උපකරණයක් බවට ජනමාධ්‍ය පත් කර ගත හැකිය. එනමුදු නූතන ජනමාධ්‍යයේදී බොහෝ විට දැකිය හැක්කේ නව නිර්මාණයන් වෙනුවට අනුකරණයකි. අනුකරණ ක්‍රියාදාමයන් මත පදනම් වූ විවිධ තරඟ ඉසව් සඳහා ඉහළ ප්‍රචාරයක් ලබා දෙමින් අනුකරණය විශිෂ්ටත්වයේ ලා සැලකීමට නූතන ජනමාධ්‍යයය සැදී පැහැදී සිටී.

බුද්ධිමත් ප්‍රේක්ෂකයාගේ වගකීම වනුයේ නූතන ජනමාධ්‍ය ෂ අසීමිත බලය හඳුනාගෙන සමාජයේ යහපැවැත්ම උදෙසාම ඒවා භාවිතයට ගැනීමයි. සමාජ විරෝධී ක්‍රියා අවම කර ගැනීම සඳහා ආකල්ප වෙනසක් ඇති කරනු පිණිස දෙනු ලබන පණිවුඩය වඩාත් සංවේදී ලෙස ඉදිරිපත් කළ හැකිය.

''බුද්ධි කලම්බනයක නවමු මග''

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## සාරාංශය

- **පහත සඳහන් ඡේදය කියවා වචන 130 කට පමණ සාරාංශ කරන්න. උචිත මාතෘකාවක් ද දෙන්න.**

එක්තරා නිශ්චිත කාලපරිච්ඡේදයක සිට ජාතික දේශපාලන පක්ෂවල පරමාර්ථය මුළුමනින්ම ජාතික බව අපි දුටු වෙමු. නිදහස පිළිබඳ සටන් පාඨ මගින් ඔවුහු ජනතාව සංවිධානය කරති. එහෙත් අනාගතය ඉන්පසු වන සිද්ධීන් අනුව හැඩගැසීමට ඉඩ හරී. ඔවුන් උද්ඝෝෂණ මාර්ගයෙන් අපේක්ෂා කරන නව රජයේ ආර්ථික ප්‍රතිපත්තීන් ගැන හෝ පිහිටුවීම අදහස් කරන ආණ්ඩුවේ ස්වරූපය ගැන හෝ ප්‍රශ්න කරන විට ඔවුන් නිසි පිළිතුරක් දීමට අපොහොසත් වෙති. ඔවුන් තම රටේ ආර්ථිකය ගැන ඇත්ත වශයෙන් කිසිත් නොදන්නා හෙයින් මේ තත්ත්වය පැන නගී.

රටේ ආර්ථිකය දිගටම වැඩී ඇත්තේ ඔවුන්ගේ දැනීමේ සීමාවන්ට පිටතිනි. තම රටේ පසේ හා ඛනිජමය සම්පත්වල සැබෑ හෝ සත්‍ය තත්ත්වය ගැන ඔවුන් තුළ ඇත්තේ පොතට සීමා වූ දළ හැඟීමක් පමණි. ඒ නිසා තම රටේ සම්පත් ගැන ඔවුන්ට කතා කළ හැක්කේ පොදු අවිශේෂ අන්දමකිනි. නිදහස ලැබීමෙන් පසු සංඛ්‍යාවෙන් අඩු වූ ප්‍රාග්ධනය අතින් හීන වූ විප්ලවීය මාර්ගයකට බැසීම ප්‍රතික්ෂේප කරන්නා වූ ද, මේ ඌණ සංවර්ධිත මධ්‍යම පන්තිය අති ශෝචනීය නිශ්චත්වයට වැටෙයි. යටත් විජිත ආධිපත්‍යය නිසා නෛසර්ගික ශක්තීන්ගේ වැඩීමට ඉඩක් නොවී යයි අඳෝනා කිරීමට පුරුදුව සිටින මේ පන්තිය ඒ ශක්තීන් නිදහසේ වඩා ගැනීමට දැන් වුව ද අපොහොසත් වෙයි. සම්පත්වල ඇති අස්ථායිභාවයත්, කළමනාකාරීත්ව ඥානයේ දුර්වලතාවයන් නිසා ඔවුහු අවුරුදු ගණනාවකට තාක්ෂණික ආර්ථික ක්‍රමයකට තල්ලු වෙති. ඔවුන්ගේ නිතැතින් ම සීමිත කල්පනා විධි අනුව, ජාතික ආර්ථිකය වනාහි දේශීය නිෂ්පාදනයන් යයි කිව හැකි දේ මත පදනම් වූ ආර්ථිකයකි. ශිල්පීය පන්තිය ගැන දීර්ඝ දේශනා පවත්වනු ලැබේ. පොදු වශයෙන් සහ පුද්ගලික වශයෙන් තමාටත් ජාතියටත් වැඩි ලාභ උපයා දෙන කර්මාන්ත ශාලා පිහිටුවීම මධ්‍යම පන්තිය අසමත් වන නිසා ම ජාතික ගරුත්වය ගැන විහිදී යන නව බුද්ධියට අනුව ද ආකූල දේශානුරාගීය දයාවකින් මේ ශිල්පීය පන්තිය වටකරනු ලැබේ. එමගින් මහත් ධනය උපයා ගැනීමට ඔවුන්ට මං සැලසෙන්නේ වැරදීමකින් නොවේ. දේශීය නිෂ්පාදන ගැන ඇති වන මේ පූජනීය ආකල්පයන් හා නව කළමනාකාරිත්ව තන්ත්‍ර ගොඩනැංවීමට නොහැකියාවෙන් සලකුණු කෙරෙන ජාතික මධ්‍යම පන්තියේ දුර්වලතා යටත් විජිත යුගයට ආවේණික වූ කෘෂිකර්ම නිෂ්පාදන විධිවල එරී සිටීමෙන් ද ප්‍රකාශ වේ.